# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,887 — 1970 ජනවාරි 2 වැනි සිකුරාදා — 1970.1.2

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1 | තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 24 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 17 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 24 |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 22 | විවිධ දැන්වීම් ... ... ... ... | — |



## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලි රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා මෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) **යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.**

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1—69542 (1/70)

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන්හිදී හැර ඔවුන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂා සේවා කාලය අවසානයේ දී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්වයක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළ දී සමත්වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාලපරිච්ඡේදයන් ඇතුලත මේ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. ස්වකීය ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

**සංලක්ෂ්‍යය.**—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාල නො වන්නේ ය.)

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රාජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය ගිනි නිවන සේවා, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර සෑම කෙනෙකුටමද) ඔවුනු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ අතුර තමන් සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එසේකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරන ලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදාදැයි, ඒ සඳහා සපයා ඇති “ආ” සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින් ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානිහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත්ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. **සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුලත් නොවේ.

---

අංකය : ඒ. 92/එක්ස්. 2176/69

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල II වෙනි ශ්‍රේණියේ ජන විඥපනය පිළිබඳ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල ජන විඥපනය පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළයුතු අයදුම්පත් පහත සඳහන් දිනයන්හි හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

1. මෙරට අයදුම්පත් : 1970 ජනවාරි මස 31 වැනිදා.
2. පිටරට අයදුම්පත් : 1970 පෙබරවාරි මස 5 වැනිදා.

**සටහන්.**—(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දාවූ ද මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතු ය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටේ පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතුවෙයි.

2. **වැටුප් දීමනා හා සේවා කොන්දේසි.**—(1) මෙම තනතුර සඳහා රු. 6,720—12×360—රු. 11,040 වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් නියමිතය.

(2) තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුය. දැනට ඇබෑර්තු ඇත්තේ දෙහිවල හා පලාලි කණිෂ්ඨ විශ්ව විද්‍යාලවලය. තෝරා ගනු ලබන අපේක්ෂකයින් මේ විශ්ව විද්‍යාලවලට පත්කරනු ලැබේ.

3. **බඳවා ගැනීමේ කොන්දේසි.**—(1) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

(2) මෙම පත්වීම ප්‍රථමකොට අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වනු ඇත.

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධියක් සහ ලංකා සමාජ සේවා පාසැලේ සමාජ සේවා කටයුතු පිළිබඳ ඩිප්ලෝමාව ; හෝ

(iii) පිළිගත් විශ්ව විද්‍යාලයක මාර්ගෝපදේශය හා උපදෙස් දීම පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(ඇ) දෙහිවල ගාල්ල, කෑගල්ල, පොල්ගොල්ල හා කුලියාපිටිය කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල තනතුරු සඳහා අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබීම අවශ්‍ය වේ. පලාලි කණිෂ්ඨ විශ්ව විද්‍යාලයේ තනතුරු සඳහා අයදුම් කරුවන්ට දෙමළෙන් වැඩ කිරීමට මනා දැනීමක් තිබීම අවශ්‍ය ය. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේදයක් තුළදී සිංහල හෝ දෙමළ (අදාල විය හැකි පරිදි) පිළිබඳ නියමිත තත්ත්වයක වැඩිපුර ප්‍රවීණතාවයක් ලබා ගන්නා ලෙස පත්වීම සඳහා තෝරා ගන්නා ලද ඕනෑම තැනැත්තෙකුගෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ට ඉල්ලා සිටිය හැකි ය.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්තවීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත.

(අ) උප්පැන්න සහතිකය (**සැ. යු.**—බෞතිස්ම සහතික හෝ උපකෘත පාසල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නො ලැබේ.)

(ආ) උපාධිය සහ උසස් ම අධ්‍යාපන සහතික.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඉ) සිංහලෙන්/දෙමළෙන් සමත් වූ උසස් ම විභාගයේ සහතික පත්‍රය.

**සංලක්ෂ්‍යය.**—(1) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නො ඇමිණිය යුතුයි.

(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවාවේ නියුක්ත නිලධාරීන් විසින් තම තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතු ය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකි ය.

7. අයදුම්පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නො එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට, ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන් ගේ ඉල්ලුම් පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ 1, ගාළු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

1—103/2—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ 95/එක්ස්. 2178/69

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල II වෙනි ශ්‍රේණියේ රක්ෂණය පිළිබඳ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කණිෂ්ඨ විශ්ව විද්‍යාල වල රක්ෂණය පිළිබඳ 2 වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළයුතු අයදුම්පත් පහත සඳහන් දිනයන්හි හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

1. මෙරට අයදුම්පත් : 1970 ජනවාරි මස 31 වැනි දින.
2. පිටරට අයදුම්පත් : 1970 පෙබරවාරි මස 5 වන දින.

**සටහන්.**—

(i) **මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතු ය.**

(ii) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයක් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයා ගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන් ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතුවෙයි.

2. **වැටුප්, දීමනා හා සේවා කොන්දේසි.**—

(i) **මෙම තනතුරු සඳහා රු. 6,720—12×360—රු. 11,040 වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් නියමිතය.**

(ii) **තෝරාගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුය. දැනට ඇබෑර්තු ඇත්තේ දෙහිවල කණිෂ්ඨ විශ්ව විද්‍යාලයේ ය. තෝරා ගනු ලබන අපේක්ෂකයින් මේ විශ්ව විද්‍යාලයට පත්කරනු ලැබේ.**

**3. බඳවා ගැනීමේ කොන්දේසි.**—

**(1) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.**

**(2) මෙම පත්වීම ප්‍රථමකොට අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වනු ඇත.**

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින් ම ඔහු/ඇ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1970.1.31 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු බවට හා අවුරුදු 40 ට නොවැඩි බවට, (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරන අයගේ අයදුම්පත් උපරිම වයස් සීමාව ගැන නොතකා සලකා බලනු ඇත.)

(ආ) (i) ලංඩන්හි වරලත් රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකුවීම හෝ ඊට සමාන හෝ උසස් සුදුසුකමක් ; සහ

(ii) කවර හෝ රක්ෂණ කාර්යාංශයකට අයත් පරිපාලන තනතුරක අවුරුදු (5) පහක පළපුරුද්දක් ලබා තිබීම.

(ඇ) දෙහිවල කණිෂ්ඨ විශ්ව විද්‍යාලයේ තනතුරු සඳහා අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබීම අවශ්‍ය වේ. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේදයක් තුළදී සිංහල පිළිබඳ නියමිත තත්ත්වයක වැඩිපුර ප්‍රවීණතාවයක් ලබා ගන්නා ලෙස පත්වීම සඳහා තෝරා ගන්නා ලද ඕනෑම තැනැත්තෙකුගෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ට ඉල්ලා සිටිය හැකි ය.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්තවීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතිස්ම සහතික හෝ උපකෘත පාසල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නො ලැබේ.)

(ආ) උපාධිය සහ උසස් ම අධ්‍යාපන සහතික.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඉ) සිංහලෙන් සමත් වූ උසස් ම විභාගයේ සහතික පත්‍රය.

**සංලක්ෂ්‍යය :**

(1) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නො ඇමිණිය යුතුයි.

(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවා නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නො එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට, ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 26 වැනිද,
කොළඹ 1, ගාළු මුවදෙර මහා ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

12–103/3—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. 96/එක්ස් 2179/69.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල II වෙනි ශ්‍රේණියේ ලේකම් කලා පරිචය පිළිබඳ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල ලේකම් කලා පරිචය පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අපෙක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළයුතු අයදුම්පත් පහත සඳහන් දිනයන්හි හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

1. මෙරට අයදුම්පත් : 1970 ජනවාරි මස 31 වැනිදා.
2. පිටරට අයදුම්පත් : 1970 පෙබරවාරි මස 5 වැනිදා.

**සටහන්**—

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමානයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොඇලුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතු ය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයක් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතුවෙයි.

2. **වැටුප්, දීමනා හා සේවා කොන්දේසි**—

(i) මෙම තනතුර සඳහා රු. 6,720—12 × 360—රු. 11,040 වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් නියමිතය.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුය. දැනට ඇබෑර්තු ඇත්තේ දෙහිවල, ගාල්ල, කුලියාපිටිය, කෑගල්ල, පොල්ගොල්ල සහ පලාලි කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල ය. තෝරාගනු ලබන අපේක්ෂකයින් මේ විශ්ව විද්‍යාවලට පත්කරනු ලැබේ.

3. **බඳවා ගැනීමේ කොන්දේසි**

(1) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

(2) මෙම පත්වීම ප්‍රථමකොට අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින් ම ඔහු/ඇය පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1970.1.31 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු බවට හා අවුරුදු 40 ට නොවැඩි බවට (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරන අයගේ අයදුම්පත් උපරිම වයස් සීමාව ගැන නොතකා සලකා බලනු ඇත.)

(ආ) (i) ලේකම්වරුන්ගේ වරලත් ආයතනයේ හෝ ලේකම්වරුන්ගේ සමායතනයේ අවසාන විභාගයෙන් සමත් වී සිටීම ; **හෝ**
සමාන හෝ උසස් අධ්‍යාපන සුදුසුකම් ; **සහ**

(ii) ලේඛක කටයුතු පිළිබඳ කාර්යාංශයක විධායක තනතුරක තුනක පළපුරුද්දක් ලබා තිබීම **හෝ** ලේඛණ කලා පරිචය ඉගැන්වීමෙහි අවුරුදු තුනක පළපුරුද්ද.

(ඇ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්තවීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපකෘත පාසල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නො ලැබේ.)

(ආ) උපාධිය සහ උසස් ම අධ්‍යාපන සහතික.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයා ගෙන් විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඉ) සිංහලෙන් සමත් වූ උසස් ම විභාගයේ සහතික පත්‍රය.

**සංලක්ෂ්‍යය.**—(1) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නොඇමිණිය යුතුයි.

(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවා නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතු ය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකි ය.

7. අයදුම්පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණ බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණ බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 26 වැනිද,
කොළඹ 1, ගාළු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය,
තැ. පෙ. 500.

1–103/5—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. 98/එක්ස්. 2181/69.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල II වෙනි ශ්‍රේණියේ වාණිජ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල වාණිජ විද්‍යාව පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළයුතු අයදුම්පත් පහත සඳහන් දිනයන්හි හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

(1) මෙරට අයදුම්පත් : 1970 ජනවාරි මස 31 වැනිදා.

(2) පිටරට අයදුම්පත් : 1970 පෙබරවාරි මස 5 වැනිදා.

**සටහන්.**—(1) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දාවූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතු ය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයක් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතු ය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයා ගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(vi) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන් ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතුවෙයි.

2. **වැටුප්, දීමනා හා සේවා කොන්දේසි.**—(1) මෙම තනතුර සඳහා රු. 6.720—12 × 360—රු. 11,040 වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් නියමිතය.

(2) තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුය. දැනට ඇබෑර්තු ඇත්තේ ගාල්ල/කුලියාපිටිය/කෑගල්ල/පොල්ගොල්ල සහ පලාලි කණිෂ්ඨ විශ්ව විද්‍යාලවලය. තෝරා ගනු ලබන අපේක්ෂකයින් මේ විශ්ව විද්‍යාලවලට පත්කරනු ලැබේ.

3. **බඳවා ගැනීමේ කොන්දේසි.**—(1) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

(2) මෙම පත්වීම ප්‍රථමකොට අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින් ම ඔහු/ඈ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1970.1.31 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු බවට හා අවුරුදු 40 ට නොවැඩි බවට, (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරන අයගේ අයදුම්පත් උපරිම වයස් සීමාව ගැන නොතකා සලකා බලනු ඇත.)

(ආ) ගණකාධිකරණය විශේෂ විෂයය ලෙස ඇතිව පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

(ඇ) ගාල්ල, කෑගල්ල, පොල්ගොල්ල හා කුලියාපිටිය කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල තනතුරු සඳහා අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබීම අවශ්‍ය වේ. පලාලි කණිෂ්ඨ විශ්ව විද්‍යාලයේ තනතුරු සඳහා අයදුම්කරුවන්ට දෙමළෙන් වැඩ කිරීමට මනා දැනීමක් තිබීම අවශ්‍ය ය. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේද යක් තුළදී සිංහල හෝ දෙමළ (අදාල විය හැකි පරිදි) පිළිබඳ නියමිත තත්ත්වයක වැඩිපුර ප්‍රවීණතාවයක් ලබා ගන්නා ලෙස පත්වීම සඳහා තෝරා ගන්නා ලද ඕනෑම තැනැත්තෙකුගෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ට ඉල්ලා සිටිය හැකි ය.

(ඇ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්තවීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපකෘත පාසැල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නො ලැබේ.)

(ආ) උපාධිය සහ උසස් ම අධ්‍යාපන සහතික.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයා ගෙන් විය යුතුය.

සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබුනාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 26 වැනිදා,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යලයේ දීය.
තැ. පෙ. 500.

1–103/9—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී 97/එක්ස් 2186/69

## භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව

**සහකාර භූ විද්‍යාඥ හෝ පුහුණුව ලබන සහකාර භූ විද්‍යාඥ තනතුරු**

භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර භූ විද්‍යාඥ හෝ පුහුණුව ලබන සහකාර භූ විද්‍යාඥ තනතුරු සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කායශීලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර.—1970 ජනවාරි මස 31 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර.— 1970 පෙබරවාරි මස 5 වැනිදා.

**සටහන්.**—(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දාවූ මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කායශීලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කායශීලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

**සහකාර භූ විද්‍යාඥවරු :**

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම ප්‍රථමයෙන් තුන් අවුරුදු ආධුනික කාලසීමාවක් මතය.

3. වැටුප්.—තනතුරට අදාල ඒකාබද්ධ වැටුප් ක්‍රමය—වර්ෂයකට රු. 6,720 පටන් ගෙන රු. 360 වාර්ෂික වැටුප් වැඩිවීම් 12 කින් සහ රු. 480 වාර්ෂික වැටුප් වැඩිවීම් 11 කින් වර්ෂයකට රු. 16,320 දක්වා වැඩිවනු ඇත. වාර්ෂික වැටුප රු. 11,520 ට හා රු. 14,880 නැගීමට පෙර කායශීක්ෂමතා කඩඉම් ඇත්තේය. අනුමත කරනු ලබන භූ විද්‍යා අංශයක පශ්චාත් උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් ලබා නොගතහොත් හෝ පිළිගත් විද්‍යා සඟරාවක ඔහුගේම විද්‍යා වැඩ කටයුතු පිළිබඳ අංශයේ නිර්මාණයක් ප්‍රසිද්ධ කර නොතිබුණහොත් හෝ වැටුප් පරිමාණයේ රු. 11,520 වාර්ෂික වැටුප ඉක්මවා යෑමට තෝරාගත් අයදුම්කරුවන්ට ඉඩ නොදෙනු ඇත. රු. 11,520 කායශීක්ෂමතා කඩඉමෙන් සමත් කිරීම පිණිස එවැනි නිර්මාණයන්හි වටිනාකම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් විනිශ්චය කරනු ලැබේ. තෝරාගන්නා අවස්ථාවේ අයදුම්කරුට පශ්චාත් උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් තිබුණහොත් හෝ පිළිගත් විද්‍යා සඟරාවක පළ කරන ලද නිර්මාණයක් ඔහු සතු වුවහොත් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් එම ප්‍රසිද්ධ කරනු ලබන නිර්මාණයන්ගේ වටිනාකම විනිශ්චය කිරීමෙන් අනතුරුව රු. 7,800 ආරම්භක වැටුපෙහි ඔහු තබනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හෝ හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියකු වීම.

(ඇ) 1970.1.31 දිනට වයස අවුරුදු 22 නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩිවීම. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.)

(ඈ) පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවන හෝ දෙවන පංතියේ ගෞරව සාමාර්ථයක් සහිතව භූ විද්‍යාවෙන් විද්‍යාවේදී (විශේෂ) උපාධිය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක භූ විද්‍යාවෙන් පශ්චාත් උපාධිය.

**පුහුණුව ලබන සහකාර භූ විද්‍යාඥවරු :**

5. **සුදුසුකම්, සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි, දීමනා, හා සේවා කොන්දේසි :**

(1) සහකාර භූ විද්‍යාඥයන් ලෙස පත් කිරීම පිණිස 4 වැනි ඡේදයේ ඇතුළත් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් නොවූවහොත් පහත සඳහන් සුදුසුකම්වලින් යුත් අයදුම්කරුවන් පුහුණුව ලබන සහකාර භූ විද්‍යාඥයන් ලෙස තෝරා ගනිම සඳහා සලකා බලනු ඇත. සහකාර භූ විද්‍යාඥ තනතුරුවලට පත් කිරීමට පෙරාතුව ඔවුනු පළමුවන හෝ දෙවන පංතියේ ගෞරව සහිතව භූ විද්‍යා විද්‍යාවේදී (විශේෂ) උපාධිය ලබාගත යුත්තාහ.

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය භූ විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුව පළමුවන හෝ දෙවැනි පංතිය ලබාගත් අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

**සටහන.**—භූ විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව, ඉකුත් විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි පරීක්ෂණයට පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අයදුම්කරුවන් ගෙන්ද ඉල්ලුම් පත් භාරගනු ලැබේ. ඔවුන්ගේ ඉල්ලුම් පත් සලකා බලනුයේ ප්‍රතිඵල නිකුත්වී සතියක් ඇතුළතදී තමන් සමත්වීද යන්න මං වෙත දැන්වුවහොත් පමණි.

(ආ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් ඇති භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ද "පුහුණුව ලබන සහකාර භූ විද්‍යාඥ" තනතුරුවලට පත් කිරීම පිණිස සලකා බැලීම සඳහා සුදුස්සන් වේ :—

(i) විද්‍යා විෂයයන් තුනක් ඇතිව අ. පො. ස. (උසස් පෙළ)

(ii) භූ විද්‍යාව සහ පහත සඳහන් විෂයයන්ගෙන් එකක් ඇතිව අ. පො. ස. (උසස් පෙළ) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව හෝ සත්ව විද්‍යාව.

**සටහන.**—භූ විද්‍යව එක් විෂයයක් වශයෙන් ඇති විද්‍යා විෂයයන් දෙකක් සහිත අයදම්කරුවෝ. තමන් භූ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය සඳහා ප්‍රවේශ අවශ්‍යකම් සපුරා ඇති බවට සාධක ඉදිරිපත් කළ යුත්තාහ.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—**

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය. පත්වීම තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් ය. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරගනු ලැබේ.

(ii) තෝරාගනු ලැබූ අපේක්ෂකයා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

3. **වැටුප් සහ දීමනා.—**මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රුපියල් 13,800 න් පටන් ගෙන රුපියල් 600 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 4 කින් යුක්තව වර්ෂයකට රුපියල් 16,200 දක්වා වැඩි වනවා ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.—**සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1970. 1. 31 දිනට වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර වයස අවුරුදු 45 ට නොවැඩි බව (රජයේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන්ට මෙම වයස් සීමා අදාල නොවේ.)

(ඇ) ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව, ගණිත විද්‍යාව, සංඛ්‍යා ලේඛන විද්‍යාව, භූගෝල විද්‍යාව, නීති විද්‍යාව, සමාජවේදය හෝ කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව හෝ යන විෂයයකින් පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවැනි පන්තියේ හෝ දෙවැනි පන්තියේ හෝ ගෞරව උපාධියක්, එසේ නැත් නම්, යථෝක්ත විෂයයන් එකකින් පශ්චාත් උපාධියක් සහ ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට පැවරී ඇති කාර්ය ක්ෂෙත්‍රයේ හෝ ඊට සම්බන්ධ ක්ෂෙත්‍රයක හෝ වගකිය යුතු තනතුරක අඩුම වශයෙන් අට (8) අවුරුද්දක පළපුරුද්ද.

**එසේ නැත් නම්,**

රජයේ ගණකාධිකාරි සේවයේ I වැනි පන්තියේ හෝ II වැනි පන්තියේ ගණකාධිකාරීන්.

**සටහන :** ප්‍රවාහන ආර්ථික විද්‍යාව පිළිබඳ වෘත්තිය සුදුසුකම් හා පළපුරුද්දක් ඇති අයවළුන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (**සැ. යු.** : අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) පළපුරුද්ද පිළිබඳ සහතිකය (ඉහත 4 (ඇ) ඡේදය බලන්න.)

(ඉ) චරිත සහතික දෙකක්—මින් එකක් සිය අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඊ) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(උ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කායර්ාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

සී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායර්ාලයේ දී ය.
තැ. පෙ. 500.

1–103/11—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

### III වැනි ශ්‍රේණියේ විදුලි මූලික තනතුර

**සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ III වැනි ශ්‍රේණියේ විදුලි මූලික තනතුර සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘතිපත්‍රය අනුව සම්පූර්ණ කරන ලද අයදුම් පත් 1970.1.18 වෙනිදාට හෝ එදිනට පෙර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, තැ. පෙ. 535, කොළඹ 1 යන ලිපිනයට ලැබෙනසේ එවිය යුතුය.**

2. **වැටුප් ක්‍රමය :** වර්ෂයකට රු. 1,860 කින් පටන් ගෙන රු. 120 බැගින් වන වාර්ෂික වර්ධකයන් 6 කින් රු. 2,580 තෙක් නගින්නකි. (ඒකාබද්ධ වැටුප් ක්‍රමය : රු. 4,152—6 × 144—රු. 5,016).

3. **වයස් සීමාව :** 1970.1.18 වෙනි දිනට අවුරුදු 24 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 40 කට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව බලපවත්වන්නේ නැත.

4. **අපේක්ෂකයන්ට තිබිය යුතු අධ්‍යාපනික හා සෙසු සුදුසුකම් :**

(i) **ගණිතය හා භෞතික විද්‍යාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය**

හෝ

දෙකකට නොවැඩි වාර ගණනක දී ලබාගත් සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා භෞතික විද්‍යාව ඇතුළු විෂයයන් 6 කින් යුත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (**සාමාන්‍ය පෙළ**) හෝ ඊට සමාන හෝ උසස් සහතිකයක්.

(ii) ලන්ඩන්හි "සිටි ඇන්ඩ් ගිල්ඩ්ස්" ආයතනයේ පහත සඳහන් සහතික පත්‍ර නැතහොත් විදුලි හෝ යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ඊට සමාන සහතික පත්‍ර ලබා තිබිය යුතුය.

(අ) **විදුලි ඉංජිනේරු අභ්‍යාස—ප්‍රත්‍යාවර්තකධාරාව/සරල ධාරාව—ප්‍රාරම්භක**

(ආ) **විදුලි ඉංජිනේරු—අභ්‍යාස—ප්‍රත්‍යාවර්තකධාරාව/සරල ධාරාව—මධ්‍යම**

(iii) **කිලෝවොට්ස් 175 තෙක් (එම ප්‍රමාණයත් ඇතුළුව) විදුලි බල සම්පාදන ඒකකයන් සම්බන්ධව කටයුතු කරන පිළිගත් වැඩපොළෙහි යටත් පිරිසෙයින් 5ස් වර්ෂයක වත් පළපුරුද්ද ලබා තිබිය යුතුය.**

5. **සේවයෙහි යෙදවීමේ වගන්ති :** තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

6. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්වලට පහත සඳහන් සහතික පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (**සැ. යු.**) **බෞතීස්ම සහතිකය** හෝ උපකෘත පාඨශාලා සඳහා වන **නියෝග** සංග්‍රහයෙහි කාර්යයන් සඳහා නිකුත් කරන ලද **උප්පැන්න සහතිකය** හෝ භාරගනු නො ලැබේ.)

(ආ) අධ්‍යාපන සහතික.

(ඇ) කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික

(ඈ) පළපුරුද්ද පිළිබඳ සහතික.
(ඉ) චරිත සහතික දෙකක්.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියවිලි සියල්ලක්ම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතුයි.

ඩබ්ලිව්. එල්. ඩී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 535,
ලෝටස් පාර,
කොළඹ 1,

## අයදුම් පත්‍රයෙහි ආකෘතිය

### III වැනි ශ්‍රේණියේ විදුලි මූලික තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————
2. තැපැල් ලිපිනය :————.
3. උපන් දිනය හා වයස :————.
4. ඔබ ලංකාවේ පුරවැසියකු වන්නේ,
   (i) පරම්පරාවෙන් ද :————.
   නැතහොත්,
   (ii) ලියාපදිංචි වීමෙන් ද :————.
5. සමත් වූ උසස්ම විභාගය (විෂයයන් සඳහන් කළ යුතුයි.)
6. සමත් වූ කාර්මික විභාගය :————.
7. පළපුරුද්ද :————
8. විශේෂ සුදුසුකම් හා හිමිකම් :————.
9. දැනට කරන/කලින් කළ රක්ෂාවල් පිළිබඳ විස්තර :————.

10. මේ අයදුම්පතෙහි මවිසින් සපයනු ලැබූ විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් විස්තර කිසිවක් අසත්‍ය බවට හෝ වැරදි බවට ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුසු වන බව හා පත්වීමෙන් පසුව අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමට ද හේතු වන බව හොඳාකාර දන්නා බව ද ප්‍රකාශ කරමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1–110—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය—ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර තනතුරු සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් 1970 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) සහිර ලේකම්ට ලැබෙන සේ එවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත් කරනු ලබන්නන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයන් නම් ආධුනික කාලසීමාව අවුරුදු 3 ක් වන්නේ ය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක ස්ථිර කරනු ලැබ සිටින නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ පත්වීම නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මතය.

(iv) පත් කරනු ලබන්නන් තමාට නියම කරනු ලබන දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(v) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට අයත් ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය, රු. 3,864—18×144—රු. 6,456 වේ.
(1969.10.1 දිනට ප්‍රථම මීට අනුරූප වැටුප් ක්‍රමය රු. 1,620—18×120—රු. 3,780 වේ.)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 21 ට නො අඩු හා අවුරුදු 35 ට නො වැඩි විය යුතුයි. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.)

(අ) ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් ගෙන් දෙකකින් සාමාර්ථය ඇතිව, ඕනෑම විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථ දෙකක් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය,

හෝ

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාව, (සිංහල හෝ දෙමළ) ඇතුළුව ගණිතය, භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් දෙකක් සහිතව ඕනෑම විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථයන් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් විෂයයන් හයකින් (6) සමත් වී තිබීම.

(ඇ) ඉහත (ආ) ඡේදයේ සුදුසුකම් වලට සමාන හෝ ඊට වඩා උසස් සුදුසුකම් ලබා තිබීම.

(ii) පහත සඳහන් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ක්‍රියාත්මක කිරීමේ මූල ධර්ම හා උපකරණ නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම පිළිබඳව මනා දැනීමක් තිබිය යුතු අතර, එම යන්ත්‍ර උපකරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව මනා දැනීමක් තිබිය යුතුය :—

මිලි මීටර් 35 ප්‍රක්ෂේපනය
කදු ප්‍රක්ෂේපකය
එපිඩස්කෝපය
තැටි වාදනය කිරීමේ යන්ත්‍රය
පටිගත කිරීමේ යන්ත්‍රය
මිලි මීටර් 16 චිත්‍රපට හා ශබ්ද ප්‍රක්ෂේපකය.

(iii) චිත්‍රපටි පුස්තකාල වැඩ ගැන මනා දැනීමක් තිබිය යුතුය.

(iv) ඉහත (i) සහ (ii) සඳහන් වැඩ සම්බන්ධ අවුරුදු පහක පළපුරුද්දක් තිබිය යුතුය.

(v) ඡායාරූප ශිල්පය පිළිබඳ පළපුරුද්දක් තිබියයුතුය.

**සටහන.**—අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සිනමා යන්ත්‍ර ක්‍රියාකරු සහ සහකාර සිනමා යන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් අවුරුදු දහයකට නො අඩු සේවයක් ඇත්තා වූ ද, ඉහත සඳහන් (ii) සිට (v) දක්වා වූ සුදුසුකම් ඇත්තා වූ ද සේවකයින් ඉහත (i) සඳහන් අධ්‍යාපනික සුදුසුකම් නොතකා සලකා බලනු ලැබේ.

(vi) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙකුම සූදානම් විය යුතුය :—

(අ) ලැබූ ඉහළම අධ්‍යාපන සහතිකය.

(ආ) ලබා ඇති වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) ශ්‍රව්‍ය දෘශ්‍ය හා චිත්‍රපටි පුස්තකාල වැඩ ගැන පළපුරුද්ද ඔප්පු කිරීමේ සහතික.

**සටහන.**—(i) ලියකියවිලිවත්, ලියවිලිවල පිටපත්වත් අයදුම් පතට අමුණා නො එවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නො ලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එනෙකුදු වුවත් තම ඉල්ලුම්පත්‍රයේ පිටපතක් කෙළින්ම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ගේ නමට ද එවිය යුතුයි. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේ දී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් එසේ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් බාර ගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරු වලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම්පත් ලැබුණ බව දන්වනු ලැබේ. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය පසු වී දින 14 ක් ඇතුළත ඉල්ලුම්පත ලැබුණු බවට ලිපියක් නොලදහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවකු මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම්පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 දෙසැම්බර් මස 26 දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

(මෙම ඉල්ලුම් පත්‍රය අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ යුතුයි.)

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය—ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර තනතුරු**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ස්ථිර ලිපිනය :————.

3. ගම් ප්‍රදේශය :————.

4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට නියම වයස :—
   අවු :——, මාස :——, දින :——.
   උපන් දිනය :————.

5. උපන් ස්ථානය :————
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේත් පියා :————.

6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.

7. අධ්‍යාපන සුදුසුකම් :————.
   (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය/අ. පො. ස. විභාගයේදී සමත් විෂයයන් හා වර්ෂය පිළිබඳ විස්තර (සම්මාන හා විශිෂ්ඨ සාමාර්ථයන් ආදිය සඳහන් කළ යුතුයි) :————.
   (ii) ශ්‍රව්‍ය දෘශ්‍ය හා චිත්‍රපටි පුස්තකාල වැඩ ගැන පළපුරුද්ද ඔප්පු කිරීමේ සහතිකවල විස්තර :————.
   (iii) සිංහලෙන්/දෙමළෙන් සමත් වී ඇති උසස්ම විභාගයේ විස්තර :————.

8. නිවේදනයේ 5 වැනි ඡේදයේ (අ) යටතේ සේවා විස්තර; (සේවය කළ ආයතන, සේවා කාලයත්, දැරූ තනතුර සඳහන් කළ යුතුයි.) :—

9. විවාහකද ? අවිවාහකද ? වැන්දඹු ද ? :————.

10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් (අ) දිනය, (ආ) නඩු නොම්මරය, (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

11. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණ ද ? :————.

12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

13. සේවා මුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය, (ආ) නිලය, (ඇ) සේවයට බැඳුණු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

14. පාඨශාලාවෙන් අස් වූ දින සිට යෙදී සිටි රැකීරක්ෂා :————.
   (i) දරන ලද තනතුර :————.
   (ii) නියුක්තව සිටි වකවානුව :————.
   (iii) අස්වීමට හේතුව :————.

15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එහි සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් :——
   (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.
   (ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
   (ඇ) සේවය නතර කිරීමට හේතු :————.

16. දැනට යෙදී සිටින රක්ෂාව :————.
   (i) ආයතනය :————.
   (ii) තනතුර හා ශ්‍රේණිය :————.
   (iii) ඊට පත් වූ දිනය :————.
   (iv) විශ්‍රාම වැටුප් සහිත ද ? තාවකාලික හෝ අනියම් ද ? :————.
   (v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :————.
   (vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

17. වෙනත් කරුණු :————.

18. මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත්, මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය.

මගේ අංකය :——
ඔබේ අංකය : සාප/30.

අධ්‍යා. සං./ලේ.

මෙම අයදුම්පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය.*

ඉල්ලුම් පත්‍රයේ සඳහන් ........................................................ අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව්* මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
පදවි නාමය :————.

දිනය :————.

(*අදාළ නැති කොටස් කපා හරින්න)

:–101—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය

**නූතන වෛද්‍ය විද්‍යාව පිළිබඳ අර්ධකාලීන කථිකාචාර්ය තනතුර**

රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ නූතන වෛද්‍ය විද්‍යාව (දෙමළ මාධ්‍යයෙන්) පිළිබඳ අර්ධ කාලීන කථිකාචාර්ය තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

**සුදුසුකම්.**—අයදුම් කරුවන් නූතන වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශ්ව විද්‍යාලය උපාධි ධාරීන් විය යුතු අතර, දෙමළ මාධ්‍යයෙන්, ඉගැන්වීමේ හැකියාවක් ඇති අය විය යුතුය.

**දේශන.**—දිනකට පැය 2 බැගින් සතියකට පැය 10 පමණ ඉගැන්වීම කළ යුතුය.

**ගෙවීම.**—සියළු දීමනාවන් ඇතුලුව පැයකට රුපියල් 15 ක දීමනාවක් ගෙවනු ලැබේ.

2. සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර සහිත ඉල්ලුම් පත්‍ර 1970 ජනවාරි මස 20 වැනි දිනට හෝ ඉන් පෙර මා වෙත ලැබෙන්නට එවිය යුතුය.

පණ්ඩිත විලියම් අල්විස්,
විද්‍යාලයාධිපති.

ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය,
1969 දෙසැම්බර් මස 9 වැනි දින,

1–97—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### රජයේ ගුරු විද්‍යාලයන්හි ගෘහ විද්‍යා කථිකාචාර්ය තනතුරු
### (සිංහල හා දෙමළ)

ඉහතකී තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවමින් 1969.11.28 වැනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම සම්බන්ධයෙන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය 1970.1.10 දක්වා කල් දමනු ලැබේ.

1–1—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### උපාධිධාරී වෛද්‍යවරයන් විශේෂඥයන් වශයෙන් පුහුණු කිරීම සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව

උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරුන් විශේෂඥයන් වශයෙන් පුහුණු කිරීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ශිෂ්‍යත්ව පිරිනැමීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

සර්ප විෂ, කැඩුම්-බිඳුම්, ගෙඩි-වණ-පිළිකා, අක්ෂි රෝග හා චර්ම රෝග සම්බන්ධයෙන් පමණක් විශේෂඥ පුහුණුවක් ලැබීම සඳහා මෙම ශිෂ්‍යත්ව පිරිනැමෙනවා ඇත. මෙම පුහුණුවේ පරමාර්ථය වනුයේ පාරම්පරික වෛද්‍යවරුන්ට ඇති පළපුරුද්ද වෛද්‍ය කර්මය හා චිකිත්සාව ආදිය ලබා ගැනීමටය.

2. **අවශ්‍ය යෝග්‍යතාවන් :—**

(අ) ලංකාවේ හෝ ඉන්දියාවේ රජය මගින් පිළිගත් ආයුර්වේද ආයතනයකින් සිද්ධ, යුනානි හෝ ආයුර්වේද උපාධියක් ලබා සිටීම.

(ආ) ඉංග්‍රීසි, දෙමළ, සංස්කෘතික, හින්දි හෝ උර්දු යන භාෂාවන් ගෙන් එකක් හෝ වැඩි ගණනක් පිළිබඳ දැනුම අතිරේක සුදුසුකමක් සේ සලකනු ලැබේ.

(ඇ) 1970 ජනවාරි මස 20 වැනි දිනට වයස අවුරුදු 35කට නොවැඩි විය යුතුයි.

3. සියලුම අපේක්ෂක-අපේක්ෂිකාවන් ලාංකිකයන් විය යුතුයි. ලාංකික යනුවෙන් අදහස් වන්නේ, ලියාපදිංචි වීමෙන් හෝ පරම්පරාවෙන් හෝ ලංකාවේ පුරවැසි බව ලත් අයෙකුය.

4. මානසික හා ශාරීරික සෞඛ්‍ය අතින් ඉහළ තත්ත්වයක සිටීම අවශ්‍ය වේ.

5. පසුව දැනුම් දෙන දිනෙක හා වේලාවක මෙම දෙපාර්තමේන්තුවේ පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට/හෝ/හා පරීක්ෂණයකට පැමිණෙන ලෙස සුදුසුකම් ලත් අපේක්ෂකයන්ට නියම කෙරෙනු ඇත. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසියම් දීමනාවක් හෝ ගෙවනු නොලැබේ.

6. තෝරා ගන්නා අයදුම්කරුවන් තමා කැමති විශේෂඥතාවය ලබා ගැනීම පිළිබඳ පුහුණුව සඳහා දිවයිනේ එම විශේෂඥතාවය පිළිබඳ ප්‍රසිද්ධ වෛද්‍යවරුන් යටතේ නියමිත කාලය තුළ එම වෛද්‍ය ක්‍රම සම්බන්ධයෙන් පුහුණුව ලබාගත යුතුය.

7. මෙම ශිෂ්‍යත්ව කාල සීමාව අවුරුදු දෙකකි, මෙම කාල සීමාව තුළදී ශිෂ්‍යත්ව හිමිකර ගන්නා එක් එක් අයදුම්කරුවකුට මසකට සියල්ල අඩංගු රු. 100ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ. මෙම ශිෂ්‍යත්වයන් සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් තෝරා ගතහොත්, එම නිලධාරීන්ට වැටුප් සහිත නිවාඩු දීම ගැන සලකා බලනවා ඇත.

**8. සිය විශේෂඥතාවය ලබා ගැනීම සම්බන්ධයෙන් මෙම කාල සීමාව තුළ ඒ පිළිබඳ වෛද්‍යාචාර්යවරුන් කීප දෙනෙකු යටතේ පුහුණුව ලැබීමට පහසුකම් සැලසෙනවා ඇත. පුහුණුව ලබන කාල සීමාව තුළදී ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් නියම කරනු ලබන සියලුම කොන්දේසිවලට යටත් විය යුතුය.**

9. පුහුණුව අවසානයේදී සෑම ශිෂ්‍යයෙකු විසින්ම තමා උගත් විශේෂඥ වෛද්‍ය ක්‍රමය පිළිබඳව සම්පූර්ණ ග්‍රන්ථයක් සකස් කොට දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. ඔහු විශේෂඥයකු හැටියට පිළිගනු ලබන්නේ ඔහු ලබා තිබෙන පුහුණුව හා ඉගෙනීම සාර්ථකවී තිබෙන බව පෙනී ගියහොත් පමණකි. එසේ සාර්ථක ලෙස පුහුණුව අවසන් කර ඇති ශිෂ්‍යත්වධාරීන්ට විශේෂ සහතිකයක් දෙපාර්තමේන්තුව මගින් පිරිනැමෙනවා ඇත. මෙම සහතිකය පශ්චාත් උපාධි සහතිකයක් වශයෙන් ගණන් ගනු නොලැබෙන අතර, දෙපාර්තමේන්තුවේ විශේෂඥ වෛද්‍යවරු බඳවා ගැනීමේදී එම සහතිකය ලත් අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. ශිෂ්‍යත්ව කාලය තුළ සාර්ථක ලෙස පුහුණුව ලැබීමට අපොහොසත් වන අයගේ ශිෂ්‍යත්ව අවලංගු කරනු ලැබේ.

10. අයදුම්කරුවන් පහත දැක්වෙන ආදර්ශ ආකෘතිපත්‍රය අනුව සම්පූර්ණ කරනලද අයදුම්පත් 1970 ජනවාරි මස 20 වැනි දිනට හෝ ඊට පෙර, කොළඹ 8, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද කොමසාරිස් යන මගේ නිල නාමයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් කෙළවර "උපාධිධාරී වෛද්‍යවරයන් පුහුණු කිරීම් සඳහා ශිෂ්‍යත්ව" යනුවෙන් සඳහන් කළ යුතුය.

විමල් නාවගමුව,
ආයුර්වේද කොමසාරිස්.

1969 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේදී ය.

### ආදර්ශ ආකෘති පත්‍රය

**උපාධිධාරී වෛද්‍යවරයින් විශේෂඥයන් වශයෙන් පුහුණු කිරීම සඳහා ශිෂ්‍යත්ව**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
 (අ) පෙළපත් නාමය :————.
 (ආ) අනික් නම් :————.

(2) පෞද්ගලික ලිපිනය :————.

(3) ජාතිය :————.

(4) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.
 (අ) 1970. 1. 20 දිනට සම්පූර්ණ වයස :————.
 අවුරුදු :——, මාස :——, දින :————.

(5) අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය) :—
 (i) සිංහල :————.
 (ii) දෙමළ :————.
 (iii) ඉංග්‍රීසි :————.
 (iv) සංස්කෘත හෝ වෙනත් භාෂාවන් :————.

(6) වෘත්තිය සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුයි) : ————.

(7) තමන් දැනට කරන රැකියාව :————.

(8) වෛද්‍ය කර්මයේ පළපුරුද්ද :————.

(9) තමා ලැබීමට අදහස් කරන විශේෂඥතාවය කුමක්ද යනවග (ඒ සම්බන්ධව අනුගමනය කිරීමට බලාපොරොත්තු වන වැඩ පිළිවෙලේ කෙටි සටහනක්) :————.

**(10) එම විශේෂඥතාවය ලැබීම සඳහා තමා ඇසුරු කිරීමට බලාපොරොත්තු වන විශේෂඥ වෛද්‍යවරුන් කවුරුද යන වග :————.**

**ලියාපදිංචි අංකය :————.**

**(මෙම වෛද්‍යවරුන්ට පුහුණුව දීමට සතුට ප්‍රකාශ කරන ලිපි අමුණන්නේ නම් වඩා යෝග්‍ය වේ. උගන්වන වෛද්‍යවරයාටද රු. 100ක් මාස්පතා ගෙවනු ලැබේ.)**

(11) වෙනත් කරුණු :————.

මවිසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද, නිවැරදි බවද සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගන්ට පෙර දැන ගන්නට ලැබුණහොත් මා මෙම ශිෂ්‍යත්වයට නුසුදුස්සකු වන බවද, ශිෂ්‍යත්වය ලැබීමෙන් පසු දැන ගන්නට ලැබුණ හොත්, වහාම ශිෂ්‍යත්වය අවලංගු කරනු ලබන බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

1–99—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

මගේ අංකය : එස්ඒ/1/10.

## ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

**පාවිච්චිකළ ගර්හිත කරන ලද වාහන විකිණීම පිළිබඳව පළකරනු ලබන දැන්වීමයි**

පහත සඳහන් වාහන විකිණීම සම්බන්ධයෙන් ප්‍රවෘත්ති අධ්‍යක්ෂ විසින් 1970 ජනවාරි මස 26 දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ :—

(1) අංක 2 ශ්‍රී 6089 වොක්ස්වාගන් වෑන් රථය
(2) අංක 3 ශ්‍රී 204 වොක්ස්වාගන් වෑන් රථය
(3) අංක 4 ශ්‍රී 2437 විලීස් ජීප් රථය
(4) අංක 2 ශ්‍රී 9427 වොක්ස්වාගන් වෑන් රථය
(5) අංක සීවී 632 ඔස්ටින් ලොරිය

2. ඉහත අංක 1, 2 හා 3 යටතේ දැක්වෙන වාහන කිරිල්ලපොන රජයේ චිත්‍රපට ආයතන භූමියෙහිද, අංක 4 යටතේ දැක්වෙන වාහනය ලංකා ගුවන් විදුලි සංස්ථා භූමියෙහිද, අංක 5 යටතේ දැක්වෙන වාහනය මොරටුව. වෙලෝනාවේ රජයේ චිත්‍රපට ආයතන භූමියෙහිද තබා ඇත.

3. 1970 ජනවාරි මස 26 වැනි දින පෙරවරු 10 දක්වා ප්‍රවෘත්ති අධ්‍යක්ෂගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල, සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. කොළඹ, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ අංක 7 දරණ ස්ථානයෙහි පිහිටි ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් රුපියල් 500 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කොට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැකිය.

4. සියළුම ටෙන්ඩර් පත් සීල් තබා කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි " පාවිච්චි කළ අංක ......... දරණ වාහනය මිළදී ගැනීම සඳහා ටෙන්ඩරය " යනුවෙන් ලියා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, අංක 7, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 1 යන ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර්පත් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ටෙන්ඩර්පත් සලකා බලනු නොලැබේ.

5. 1970 ජනවාරි මස 26 දින පෙරවරු 11 ට කොළඹ 1, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතෙහි අංක 7 දරණ ස්ථානයෙහි පිහිටි ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර්පත් විවෘත කරනු ඇත. ටෙන්ඩර්කරුවන් කැමති නම්, ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටිය හැක

6. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙර, සතියේ වැඩකරන වේලාවන් තුළදී ඉහත අංක 2 දරණ ඡේදයේ සඳහන් ස්ථානවලදී මෙම වාහන පරීක්ෂාකර බලන ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවළුන්ට උපදෙස් දෙනු ලැබේ. ටෙන්ඩර් පතෙහි කිසියම් වෙනසක් හෝ මකාදැමීමක් වේතොත් ඒවාට ටෙන්ඩර්කරු විසින් කෙටි අත්සන යෙදිය යුතුය.

7. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය භාරගත් බව දැනුම් දී දින 6 ක් ඇතුළත සම්පූර්ණ මුදල ගෙවා එසේ ගෙවූ දින සිට දින 10 ක් ඇතුළත වාහනය ඉවත් කරගත යුතුය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ කිරීම පැහැර හැරියොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලබන අතර රජයේ කොන්ත්‍රාත් සම්බන්ධ අපලේඛණගත කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඔවුන්ගේ නම් ඇතුළත් කිරීමට හැකිවෙනවා ඇත.

8. එක් එක් වාහනය සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් ඉදිරිපත් කළයුතුය. ඉදිරිපත්කරනු ලබන ඕනෑම ටෙන්ඩරයක් හෝ එයින් කොටසක් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රවෘත්ති අධ්‍යක්ෂ වෙත රඳවාගනු ලැබේ. ඔහුගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

9. විකුණනු ලබන වාහන අළුත්වැඩියා කිරීම හෝ එම වාහනවල ඇතිවියහැකි කිසියම් දෝෂයක් පිළිබඳව හෝ කවර වගකීමක්වත් දෙපාර්තමේන්තුව බාරගනු නොලැබේ. වාහනය දැනට ඇති තත්වයන්ම විකුණනු ඇත.

10. සාර්ථක ටෙන්ඩර්කරු විසින්ම වාහනය ලියා පදිංචි කිරීම සඳහා වූ සියළු වියදම්ද දැරිය යුතුය.

:——————

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ.

1969 දෙසැම්බර් මස 27 වැනි දින.

1–2—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—වවුනියා උප කොටස

වවුනියා උප කොට්ඨාශයට අයත් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් උතුරු කොට්ඨාශය භාර, වවුනියාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 ජනවාරි 24 වෙනි සෙනසුරාදා පෙරවරු 10 දක්වා බාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 72,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වී ඇති, ලාංකික වූ කොන්ත්‍රාත්කරුවන්, සමූපකාර සමිති හා ග්‍රාමසංවර්ධන සමිති පමණක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයැදුම්පත් එවීමට සුදුස්සෝ වෙති :—

| වැඩ විස්තරය | ටෙන්ඩර් ඇප මුදල |
|---|---|
| **කල් ආරු අමුණ ඉදිකිරීමේ ව්‍යාපාරය** | |
| ඇල අලුත්වැඩියා කිරීම හා වැඩි දියුණු ... කිරීම. | රු. 100.00 |

3. 1970 ජනවාරි 20 වෙනිදා ප. ව. 3 වන තෙක් කාර්යාල වේලාවන් තුලදී වවුනියාව, වවුනිකුලම, මුලතිව්, යාපනය සහ මන්නාරම යන වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වලින් ලබා ගත හැකි ෆෝර්ම වල ටෙන්ඩර් අයැදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් හා දැනට ඔවුන් දෙපාර්තමේන්තුවේ කරන වැඩ සහ ඒවායේ වටිනාකම් දක්වන ප්‍රකාශයන්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

4. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඉහත නියමිත කළ පරිදි තැන් පත් මුදලක් ඉහත සඳහන් වාරිමාර්ග කාර්යාලවල හෝ කච්චේරියක වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවෙන් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

5. උපකරණ සහ ද්‍රව්‍ය, මේ වැඩ සඳහා දෙපාර්තමේන්තුවෙන් සපයනු නොලැබේ.

6. මේ සඳහා වැඩි විස්තර වවුනියා උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුලදී ලබාගත හැක.

එස්. ඕ. ඒ. සෝමනාදර්,
වාරිමාර්ග ඉංජිනේරු, වවුනියා උප කොට්ඨාශය.

වවුනියාව,
1969 දෙසැම්බර් 21 වෙනිදා.

1–102—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—බදුල්ල උප කොටස

බදුල්ල උප කොටස යටතේ බණ්ඩාරවෙල, කහත්තේවෙල හනිකඩ පොදු නිවස ප්‍රතිසංස්කරණය කිරීමේ ඉතිරි වැඩ සඳහා ටෙන්ඩර් පත් භාර ගැනීම 1970 ජනවාරි මස 24 දින පෙරවරු 10 දක්වා බණ්ඩාරවෙල ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තැන විසින් කරනු ලබයි. ටෙන්ඩර් පත් විවෘත කිරීමද එකී අවස්ථාවේදීම සිදුකෙරේ.

2. රුපියල් 35,000ක් හෝ ඊට වැඩි මුදලකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැක.

3. 1970 ජනවාරි මස 20 දින තෙක් කායාීාල වේලාවන් තුළදී, බදුල්ල, මහියංගන හා මොනරාගල වාරිමාර්ග ඉන්ජිනේරු වරුන්ගේ කායාීාල වලින් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ආකෘති පත් සඳහා ඉල්ලුම් කරන විට ටෙන්ඩර් කරුවන් විසින් තමාගේ ලියාපදිංචි පොත, දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කරනු ලබන වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක් ටෙන්ඩරය ඉදිරිපත් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉන්ජිනේරු තැන වෙත ඉදිරි පත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් ලබා ගැනීමට ටෙන්ඩර් ඇප මුදල වන රු. 50 වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කායාීාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ පිළිබඳව වැඩි විස්තර බදුල්ලේ වාරිමාර්ග ඉන්ජිනේරු තැනගෙන් කායාීාල වේලාවන් තුළදී ලබාගත හැකිය.

වී. නාගේන්ද්‍රන්,
වාරිමාර්ග ඉන්ජිනේරු,
බදුල්ල උප කොටස.

වාරිමාර්ග කායාීාලය, බදුල්ල,
1969 දෙසැම්බර් මස 22 දින දීය.

1–10—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**මහ ඉලුප්පල්ලම ගොවිපල නිවාස සඳහා ගොඩනැගිලි 8 ක් ඉදිකිරීම**

1. ඉහත සඳහන් ගොඩනැගිල්ල තැනීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 පෙබරවාරි මස 8 වැනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. කොළඹ 5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන් විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ද ලබා ගත හැකිය.

3. ටෙන්ඩර් කරුවන් රු. 350,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970.1.24 වැනි දින පස්වරු 4 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්,

(ආ) රුපියල් 250 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969.12.17 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ 5.

1–95—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ටෙන්ඩර්**

පහත සඳහන් උපකරණ සැපයීම සඳහා 69.12.5 වෙනි දින නිකුත් කොට ඇති අංක 14,883 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ දැන්වීම අනුරු කැඳවන ලද ටෙන්ඩර් භාරගැනීමේ දිනය හා වේලාව 70.1.25 වෙනි දින පස්වරු 2.30 තෙක් දීර්ඝ කොට ඇත. ටෙන්ඩර් පෝර්ම 70.1.23 වෙනි දින පස්වරු 2.30 තෙක් නිකුත් කරනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | | සේවය |
|---|---|---|
| ඇම්. ඊ. 697008 | ... | ස්ප්‍රින්ක්ලර් ඉරිගේෂන් යුනිට් 1 යි. |
| ඇම්. ඊ. 697018 | ... | වතුර පොම්ප 2 යි. |

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969 දෙසැම්බර් 24 වෙනි දින,
පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ඉංජිනේරු අංශයේදීය.

1–107—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ටැන්ඩර්**

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් සභාපති විසින් පහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීම පිණිස ප්‍රාදේශික නියෝජිතවරුන් ගෙන් ටැන්ඩර් 1970 පෙබරවාරි මස 2 වෙනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | සේවය | ටැන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|
| ඇම්. ඊ. 697017 | අඟල් 2 සෙන්ට්‍රිෆියුගල් වතුර පොම්ප (50) | රු. 50. |

2. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු (ඉංජිනේරු අංශය) වෙතින් ලබාගත හැකි අ.කෘති පත්‍ර මගින් ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුවේ.

3. ටැන්ඩර් පිටපත් තුනකින් එවිය යුතු අතර සෑම පිටපතක්ම අත්සන් තබා මුද්‍රා තබන ලද කවරයක බහා ඉදිරිපත් කළ යුතු අතර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති යනුවෙන් ලිපිනය සඳහන් එම මුද්‍රා තබන ලද කවරයේ වම් පස ඉහත කෙලවරේ "70.2.2 වැනි දින වසනු ලබන අඟල් 2 සේන්ට්‍රිෆියුගල් වතුර පොම්ප සඳහා ටෙන්ඩර් අංක ඇම් ඊ/697071" යන්න ලකුණු කොට එවිය යුතුයි.

4. ටැන්ඩර් පෝර්ම 70.1.31 වෙනි දින පස්වරු 2.30 වන තෙක් නිකුත් කරනු ලැබේ. ඉන් පසු ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු නොලැබේ.

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියකදී හෝ කොළඹ ලංකා බැංකුවේ යෝක් වීදියේ ශාඛාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක 37 දරණ ගිණුමට හෝ ඉහත සඳහන් ටැන්ඩර් තැන්පත් මුදල බැරකළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට පමණක් ටැන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු (ඉංජිනේරු අංශය) වෙතින් ලබා ගත හැකි වේ.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

69.12.21 වෙනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ඉංජිනේරු අංශයේදී ය.

1–106—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**පූනාකරියි දිස්ත්‍රික් පොහොර ගබඩාවේ හා පූනාකරියි ස. මි. යෝ. ක්‍ර. ගබඩාවේ 1970 ලින් වර්ෂයට කම්කරු හා ප්‍රවාහණ සේවා සඳහා මිල ගණන් කැඳවීම**

1970 ලින් වර්ෂයට පූනාකරි ස. මි. යො ක්‍රි. හා පොහොර ගබඩාවන්හි කම්කරු හා ප්‍රවාහණ සේවා සඳහා මිල ගණන් කැඳවීම පිණිස 1969.11.28 දින අංක 14,882 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය සම්බන්ධවයි.

මිල ගණන් කැඳවීමේ අවසාන දිනය 1970 ජනවාරි මස 16 දින දහවල් 12 දක්වා දීර්ඝ කොට තිබේ.

1970 ජනවාරි මස 16 දින දහවල් 11 තෙක් මිල ගණන් කැඳවුම් හා උපලේඛන පත් මා විසින් නිකුත් කැරේ.

ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
යාපනය දිස්ත්‍රික්කය,

1969. 12. 22 දින,
යාපනයේ, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

1–25—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### සේවයට නුසුදුසු මෝටර් රථයක් විකිණීම

කිරුළපනේ මධ්‍යම කම්මාන්ත ශාලා භූමියේ ඇති පහත දැක්වෙන සේවයට නුසුදුසු මෝටර් රථය විකිණීම සඳහා, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තැන විසින් 1970.1.16 වන දින පෙ. ව. 11 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

(1) අයි. සී. 1898 (ඔස්ටින් පී. 6 බවුසර්-ලොරිය ඇන්ජිම සහිතව)

2. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් 1970.1.13 වන දින දවල් 12 වන තෙක් ලබා ගත හැකි ටෙන්ඩර් පෝරමයක අනුපිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යාලයෙහි හෝ ලංකා බැංකුවේ (යෝර්ක් වීදියේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රු 150 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. සියලුම පිරිනැමීම හය මාසයකට වලංගු විය යුතුයි.

4. ටෙන්ඩර් පෝර්මය බහාලූ කවරය මුද්‍රා‍ද තබා, එහි උඩ වම් කෙළවරෙහි "සේවයට නුසුදුසු රථවාහන මිලදී ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා, ඇවිලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර් ලියා පදිංචි කළ තැපැලෙන් හෝ තමා විසින් ම ගෙනැවිත් දීමෙන් හෝ තමාගේ නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ ප්‍රධාන ගණකාධිකාරී තැනට භාරදී ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි. නැතහොත් ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

5. කොළඹ, ඇවිලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දී 1970.1.16 වන දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් තමන්ගේ ටෙන්ඩරය පිළිගත් බැව් දැන්වූ විට ටෙන්ඩර් කරනු ලැබූ මුදල දින 10 ක් ඇතුළතදී ගෙවිය යුතුයි. ඊට පසු දින 14ක් ඇතුළතදී ගන්නා ලද වාහනය අස්කරගත යුතුයි. බැහැර කිරීම සඳහා තමන් විසින්ම පිළිවෙළක් යොදාගත යුතුයි. නියමිත කාලය තුළදී අස්කර ගනු නොලබන වාහනය නැවත විකිණීමෙන් හෝ අන් අයුරකින් හෝ ඉවත් කරනු ලැබේ. ඊට පසු ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අනුදැනුම ඇතිව විනා අන් කිසිම අයුරකින් වාහනය සඳහා ඉදිරිපත් විය නොහැක. යම් හෙයකින් සාර්ථක වූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව පැහැර හැරියහොත්, ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව රජයේ කොන්දේසි කඩකරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයටද ඔහුගේ නම ඇතුළත් වන්නේය.

7. ටෙන්ඩර් කිරීමට අපේක්ෂා කරන්නන් එසේ කිරීමට ප්‍රථමයෙන්, කිරුළපන මධ්‍යම කම්මාන්ත ශාලා භූමියේ ඇති වාහනය පරීක්‍ෂා කර බැලීම යෝග්‍යය. ටෙන්ඩරයේ ඇති වන සියළුම වෙනස් කිරීම හා මැකීම් ටෙන්ඩර්කරු විසින් සහතික කළ යුතුයි.

8. ටෙන්ඩර් පත්‍ර මුළුමණින්ම හෝ කොටස් වශයෙන් භාර ගැනීමේ හෝ නොගැනීමේ අයිතිය රජය සතුය.

9. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකිවූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
ඇවිලන් චතුරශ්‍රය, කොළඹ 1,
69. 12. 20 දින.
සීවී/3/65

1–120—70.1.2 දින අංක 14,337 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට මෝටර් බයිසිකල් 4 ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් (ලිපිනය : දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, තැ. පෙ. 355, කොළඹ 10) 1970 පෙබරවාරි 7 වැනි සෙනසුරාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කිරීමට පෙර අවශ්‍ය වුවහොත් ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවා භාර ගැනීමට සහ සතුටුදායක ලෙස ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වයේ ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට අදාල වන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. කොළඹ 10 හි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 250 ක් කොළඹ 10 හි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට නම් ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 පෙබරවාරි මස 5 වැනි බ්‍රහස්පතින්දා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්මකොල නිකුත් කරනු ලැබේ.

5. 1970 පෙබරවාරි මස 7 වැනි සෙනසුරාදා පෙරවරු 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩිමනත් විස්තර අවශ්‍ය නම් දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබා ගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

කොළඹ,
1969 දෙසැම්බර් 20 දින.

1–121—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට බර කිරන යන්ත්‍ර 8 ක් සහ කිරුම් පාලම් 1ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් (ලිපිනය : දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, තැ. පෙ. 355, කොළඹ 10) 1970 පෙබරවාරි 7 වැනි සෙනසුරාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කිරීමට පෙර අවශ්‍ය වුවහොත් ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවා භාර ගැනීමට සහ සතුටුදායක ලෙස ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වයේ ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට අදාල වන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. කොළඹ 10 හි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 250 ක් කොළඹ 10 හි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට නම් ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 පෙබරවාරි මස 5 වැනි බ්‍රහස්පතින්දා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්මකොල නිකුත් කරනු ලැබේ.

5. 1970 පෙබරවාරි මස 7 වැනි සෙනසුරාදා පෙරවරු 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩිමනත් විස්තර අවශ්‍ය නම් දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබා ගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

කොළඹ,
1969 දෙසැම්බර් 20 දින.

1–122—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—ක්ෂය රෝග මර්දන ව්‍යාපාරය

### කිරි නොමැතිව අමු ආහාර පමණක් සැපයීම

වර්ෂ 1970 පෙබරවාරි 1 වෙනිද සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනිදයින් අවසන්වන කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයේ පළමුවැනි තීරයේ දක්වා ඇති ආයතනයට අමු ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා එවනු ලබන සීල් තබනු ලැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ 12, ක්ෂය රෝග මර්දන ව්‍යාපාරයේ අධිකාරි තැන විසින් වර්ෂ 1970 ජනවාරි 24 වෙනි දින පෙරවරු 10 වන තෙක් ලාංකිකයන්ගෙන් හෝ ලාංකික වෙළඳ ආයතනවලින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලයෙන්, ලබාගන්නා ටෙන්ඩර් ෆෝර්මවල ක්ෂය රෝග මර්දන ව්‍යාපාර අධිකාරි වෙත, අනුපිටපතක් සමඟ ටෙන්ඩර් සැපයිය යුතුයි. නියම ෆෝර්මයේ නොවන ටෙන්ඩර් පත් භාරගනු නොලැබේ.

3. මේ සමඟ ඇති උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් ප්‍රමාණයේ මුදලක් මගේ නමට, ඕනෑම කච්චේරියක තැන්පත් කළ බවට නිකුත් කෙරෙන කුවිතාන්සියක් ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළයුතුයි.

4. අයදුම්කරුවන් ටෙන්ඩර් තැන්පත් මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර්පත් භාරගැනීමේ අවසාන දිනට ප්‍රථම දින දවල් 12 ට කලින් ඉදිරිපත් කිරීමෙන්, අවශ්‍ය ෆෝර්ම ක්ෂය රෝග මර්දන ව්‍යාපාර අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැක. තැපෑලෙන් ටෙන්ඩර් ෆෝර්ම ඉල්ලුම් කරන අය කල්වේලා ඇතිව ඉහත කී කුවිතාන්සිය එවා ටෙන්ඩර් ෆෝර්ම ලබාගෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් එවිය යුතුයි.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමඟ ඇති ‘‘ ආ ’’ උපලේඛනය බලන්න. රෝගීන්ට සහ සේවකයින්ට ආහාර සැපයීමට අවශ්‍ය සහල් ප්‍රමාණය එක් අයෙකුගේ සලාකය පදනම මත ආයතනය භාර නිලධාරියා මගින් නියෝජ්‍ය ආහාර කොමසාරිස් විසින් සතිපතා ලබා ගැනීමට අවසර පත් නිකුත් කරනු ඇත.

5. සෑම ටෙන්ඩරයක්ම ක්ෂය රෝග මර්දන ව්‍යාපාර අධිකාරි තැන වෙත එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න සඳහන් කළයුතුයි. ඒ කවරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළයුතුයි.

ටෙන්ඩර්පත් ක්ෂය රෝග මර්දන ව්‍යාපාර අධිකාරි කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. ටෙන්ඩර්කරුවන්ට සිය ටෙන්ඩර්පත් ලියා පදිංචි තැපෑලෙන්ද එවිය හැක. ටෙන්ඩර්කරුවන් සිය ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් එවීමට අසතුටුනම්, ඔවුන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට මෙහි පළමුවෙනි ඡෙදයේ සඳහන් ලිපිනයේ ඇති ටෙන්ඩර් පත් භාර ගැනීමට අවසරය දී ඇති ක්ෂය රෝග මර්දන ව්‍යාපාර අධිකාරි තැනට පුද්ගලිකව ටෙන්ඩර් පත් භාරදී, එය ලැබුන බවට කුවිතාන්සියක්ද ලබාගත හැක. ටෙන්ඩර් පත් භාර ගැනීමේ අවසාන දින දවල් 10 ට පසුව තැපෑලෙන් හෝ පැමිණ භාරදෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

6. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට එම ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුගේ නම සහ ඔවුන්ගේ ටෙන්ඩර් පත්වල මිළ ගණන්ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් ක්ෂය රෝග මර්දන ව්‍යාපාර අධිකාරි තැනගේ අනුමැතිය ඇතිව එහි පිට පතක් පරීක්ෂා කළ හැක.

7. මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාතුවක් නොදරන අය ටෙන්ඩර් පත් ඉල්ලා එවීමට පෙර, තම තමන්ගේ විටිනාකම පිළිබඳ තොරතුරු ක්ෂය රෝග මර්දන ව්‍යාපාරයේ අධිකාරි වෙත දන්වා සිටිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය ෆෝර්ම ක්ෂය රෝග මර්දන ව්‍යාපාර අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැක. දැනට මෙම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්තු දරන අයදුම්කරුවන් ඒ බවද සඳහන් කළයුතුයි. දැනට මෙම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් නොදරන අය තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු සපයා තිබේද, එසේ නම් කා වෙතද, යන්න සඳහන් කළයුතුයි.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිරතාවය පිළිබඳ තොරතුරු දැනගැනීමට පෙර ටෙන්ඩර් පත්‍ර ගැන තීරණයක් කළ නොහැකිය. එබැවින් තම තමන්ගේ වටිනාකම පිළිබඳ වාර්තාවක් එවිය යුතුයි.

8. 1969 අගෝස්තු 1 වැනි දින සිට 1969 ඔක්තෝබර් 30 දින දක්වා ලබාගත් උප ලේඛනයට අයත් එක එක වර්ගයේ ආහාර ප්‍රමාණයේ විස්තර ලක් දළ වශයෙන් ටෙන්ඩර් ෆෝර්මවල ‘‘ බී ’’ උපලේඛනයෙන් පෙන්වා ඇත. ටෙන්ඩර් මණ්ඩලයේ අවසාන තීරණය රඳා පවත්නේ වියදම් වූ මුළු මුදල අනුවයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන ලද මිළ ගණන් අඩු වශයෙන් මාස 3 කාල පරිච්ඡෙදයක් දක්වා වලංගු විය යුතුයි.

10. තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය තැන්පත් කර තබනු සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩකඩ සපයා දෙනු නොලැබේ.

11. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය.

ඒ. ඇම්. ඩී. රිචර්ඩ්ස්,
ක්ෂය රෝග මර්දන ව්‍යාපාර අධිකාරි.

1969 දෙසැම්බර් මස 21 වැනි දින,
ක්ෂය රෝග මර්දන ව්‍යාපාර අධිකාරි කාර්යාලයේදීය.

### උප ලේඛනය ‘‘ අ ’’

| | (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|
| 1. | අමු ආහාර ද්‍රව්‍ය ... | 100 ... | 1,000 ... | 1970.1.24 දින පෙරවරු 10ට |

### උප ලේඛනය ‘‘ ආ ’’

| | |
|---|---|
| ගවමස් ... ... ... | රා. 185 |
| එලුමස් ... ... ... ... | රා. 115 |
| අලුත්මාලු ... ... ... | රා. 185 |
| කුකුළු මස් ... ... ... | රා. 115 |
| බිත්තර ... ... ... | — 130 |
| කරවල ... ... ... ... | රා. 180 |
| එලවළු (කොළ) ... ... ... | රා. 650 |
| එළු (අල) ... ... ... | රා. 690 |
| එළු (පිටි සහිත) ... ... ... | රා. 370 |
| වියලි මිරිස්4 ... ... ... | රා. 120 |
| කොත්තමල්ලි ... ... ... | රා. 45 |
| රතුළුනු ... ... ... ... | රා. 240 |
| පරිප්පු ... ... ... ... | රා. 470 |
| අනිත් කුළුබඩු හා කඩ සරක්කු, ... ... | රා. 130 |
| පාන් ... ... ... ... | රා. 3,425 |
| සීනි ... ... ... ... | රා. 470 |
| තේ ... ... ... ... | රා. 60 |
| බටර්/මාගරින් ... ... ... | රා. 150 |
| ජෑම් ... ... ... ... | රා. 100 |
| අර ... ... ... ... | හො. 220 |

1-111—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : එල්. ඩබ්ලිව්/2/49

## පුත්තලම කච්චේරිය

රු. 15,000 ට හෝ ඊට වඩා කොන්ත්‍රාත් සඳහා රජයේ ලියාපදිංචි වී සිටින පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන්, විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති ආදී සමිති වලින් මෙහි සඳහන් අළුත් වැඩියා කිරීම් සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් 1970 ජනවාරි මස 29 දින සවස 2.30 දක්වා පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

1. නාත්තන්ඩිය, තබ්බෝව—අක්කර අසූව පාර.

2. ඉහත සඳහන් වැඩ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර දැන ගත හැකි පුත්තලම කච්චේරියේ ඉඩම් අංශයෙන් ලබා ගත හැකි ආකෘති පත් මගින් එකී එක් එක් වැඩය සඳහා වෙන වෙනම පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය. එකී එක් එක් වැඩය සඳහා රු. 25 බැගින් පුත්තලම කච්චේරියේ තැන්පත් කර ලබාගත් කච්චේරි කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පත් ලබා ගත හැකිය. එම ටෙන්ඩර් ආකෘතිපත් 1970 ජනවාරි මස 28 වැනි දින දවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර්පත්, පුත්තලම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීම හෝ කළ හැකිය.

ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න,
පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 දෙසැම්බර් මස 21 දින,
පුත්තලම කච්චේරියේදීය.

1-113—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 ජනවාරි මස 31 වැනි සෙනසුරාදා ප. ව. 2.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර, මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. මහ/ඉල්ලගොල්ලවත්ත වි. | පාසල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ |
| 2. මහ/තැඹිලිගල, වි. ... | ක්‍රීඩා භූමිය |
| 3. මහ/උඩුවැල්ල වි. ... | වහල නැවත සවිකිරීම |
| 4. මහ/උඩුව වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 5. මහ/තලවතුර මුස්ලිම් වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 6. මහ/බුළුකොහොතැන්න මුස්ලිම් වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 7. මහ/අටබාගේ රාජානන්ද වි | පාසල් ගොඩනැගිල්ල |
| 8. මහ/උනම්බුව වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 9. මහ/වැලිගම්පල වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 10. මහ/ශ්‍රෙගරි පාර බාලිකා වි. | පාසල් ගොඩනැගිල්ල |
| 11. මහ/පිටකන්ද රේවත වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 12. මහ/දොඩන්වල ම. වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 13. මහ/බලන වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 14. මහ/ගොහාගොඩ ජයන්ති වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 15. මහ/රඹුක්ඇල මුස්ලිම් වි.... | පාසල් ගොඩනැගිල්ල |
| 16. මහ/විද්‍යාර්ථ ම. වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 17. මහ/ගෝනාවල වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 18. මහ/ගෙලිඔය වි. ... | පාසල් ගොඩනැගිල්ල |

සංලක්ෂ්‍යය—මහ=මහනුවර ප්‍රදේශය

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් වැඩ අංක 1 සිට 4 දක්වා රු. 15,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 5 සිට 11 දක්වා රු. 20,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 12 සිට 16 දක්වා රු. 25,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 17 රු. 30,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 18 රු. 35,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 ජනවාරි මස 29 වැනි බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරණු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුසෝ නොවෙත්). චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මහනුවර, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩ සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව මහනුවර අධ්‍යාපන කාර්යාලයේ පරිපාලක නිලධාරී වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 ජනවාරි මස 31 වැනි සෙනසුරාදා ප. ව. 2.30 ට මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරණු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කල දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමතිවිය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයෙන් තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

9. පළමුවන ඡේදයේ අංක 2 හා 11 දරණ වැඩ උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා යටතේ භාරගනු ලැබේ.

පී. බී. රත්නායක,
මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 දෙසැම්බර් මස 24 දින,
මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දී ය.

1–21—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## ගාලු කච්චේරිය

ගාලු දිස්ත්‍රික්කයේ මගේ පාලනය යටතේ ඇති රජයේ ගොඩ නැගිලි නඩත්තු කිරීම හා සුළු වැඩි දියුණු කිරීම් සඳහා ටැන්ඩර් පත් 1970 ජනවාරි 29 වෙනි දින පස්වරු 3 තෙක් මවිසින් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්තව ම වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් පත්‍ර,

(අ) තමන්ගේ ලියාපදිංචිවීම පිළිබඳ ලියකියවිලි හා

(ආ) ආපසු ලබා ගැනීමට හැකි රු. 10 ට ටෙන්ඩර් තැන්පත් මුදලක් ගාලු කච්චේරියේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ද ඉදිරිපත් කිරීමෙන් ගාලු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන ගෙන් 1970 ජනවාරි මස 28 වෙනි දින පස්වරු 3 තෙක් ලබා ගැනීමට පුළුවන..

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම වම් පස උඩ කෙළවරේ "ටෙන්ඩර් පත්‍ර රජයේ ගොඩනැගිලි" යනුවෙන් පැහැදිලිව ලියා මුද්‍රා තබන ලද කවරයක බහා ගාල්ලේ ආණ්ඩුවේ ඒජන්ත තැන වෙත ලියා පදිංචි තැපැලෙන් හෝ පුද්ගලිකව ගෙනවුත් ගාලු කච්චේරියේ කාර්යාල සහකාර තැනගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුවේ. කවර හේතුවක් නිසාවත් නියමිත දිනයට හා වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් පත් කිසිවක් භාරගනු නොලැබේ.

4. 1970 ජනවාරි මස 29 වෙනි දින පස්වරු 3.30 ට ගාලු කච්චේරියේ දී මෙම ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

5. ගොඩනැගිලි වැඩ සඳහා රු. 5,000 කට නොඅඩු ගණනකට රජයේ ලියාපදිංචි වූ අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති, ලියාපදිංචි කරන ලද විවිධසේවා සමුපකාර සමිති, විවිධසේවා සමුපකාර සමිති සංගම්,සමුපකාර කම්කරු සමිති සහ පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

6. වැඩි විස්තර ගාලු කච්චේරියේ කාර්යාල සහකාර තැනගෙන් ලබාගත හැක.

පී. ඒ පී. ගුණසිංහ,
ගාල්ලේ ආණ්ඩුවේ ඒජන්ත තැන.

1969 නොවැම්බර් මස 27 දින,
ගාල්ලේ කච්චේරියේ දී.

1–104—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

## මන්නාරම කච්චේරිය

මන්නාරම දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970. 1. 29 වැනි දින දහවල් 12.00 දක්වා මන්නාරම දිසාපති විසින් වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

1. පෙරියපණ්ඩි විරිච්චාන් බී. ඕ. පී. පාර .

2. මෙම වැඩ සඳහා 1970. 1. 28 වැනි දින ප. ව. 3.00 දක්වා මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති විසින් මන්නාරම කච්චේරියේදී නිකුත් කරනු ලබන ටෙන්ඩර් ෆෝර්ම, ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුතුව මන්නාරම දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි කරණ ලද ටෙන්ඩර් කරුවන් සහ ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ද මේ සඳහා සුදුස්සෝ වෙති. එම සමිතිවලින් මෙම ටෙන්ඩර් ෆෝර්ම ඉදිරිපත් කිරීමේදී, ඔවුනට මේ වැඩය කිරීමට අවශ්‍ය මුදල් ඇති බවට ඔවුන්ගේ ප්‍රාදේශීය ප්‍රධානීන්ගෙන් ලබාගත් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය. බාහිර ටෙන්ඩර් කරුවන් විසින් ඉල්ලුම් කරණ විටදී, ඉල්ලුම්කරනු ලබන එක් එක් වැඩය වෙනුවෙන් රු. 25 බැගින් මන්නාරම කච්චේරියේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසු ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරණු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිතිවලට ද මෙසේ තැන්පත් මුදල් තැබීම අනවශ්‍ය ය.

3. 1970. 1. 29 දින දහවල් 12.00 ට පෙර මන්නාරම දිසාපති වෙත ලිපිකවරයේ "මන්නාරම දිස්ත්‍රික්කයේ පෙරියපණ්ඩි විරිච්චාන් බී. ඕ. පී. පාර සෑදීම ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ මන්නාරම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් දැමීමට පුළුවන. නියමිත දිනයෙහි නියමිත වේලාවට පසුව ලැබෙන ටෙන්ඩ ගැන සලකා බලනු නොලැබේ.

4. 1970. 1. 29 දින අ. භා. 12.30 ට ටෙන්ඩර් විවෘත කරණු ලබ වේලාවේදී සියළුම ටෙන්ඩර් කරුවන්හට පැමිනීමට ඉඩ දෙනු ලැ

5. සතුටුදායක ටෙන්ඩර් කරුවන්හට ගිවිසුමකට බැඳෙන ලෙ ලියවිල්ලකින් දන්වනු ලැබේ. කොන්ත්‍රාත් කරණු ලබන මුදලි සියයට 2 ක් (2%) සතුටුදායක ලෙස නිම කිරීමට ඇප වශයෙ ඔහු විසින් තැන්පත් කළ යුතුය. මෙසේ තබන ලද මුදල් සතුටුදය ලෙස වැඩ නිම කරණ තෙක් ආපසු ගෙවනු නොලැබේ. සතුටුදය ටෙන්ඩර් කරුවන්හට මෙසේ දැනුම් දී දින 10 ක් ගෙවීමට ඉ ඔහු ගිවිසුමකට බැඳීමට අපොහොසත් වුවහොත් ඔහුගේ තැන්ප මුදල වන රු. 25 රාජ සන්තක කරණු ලැබේ.

6. නියම කරණ ලද වැඩ ප්‍රමාණයෙන් සියයට අනූවක් (90% වෙනුවෙන් මුදල් ගෙවනු ලැබේ. ඉතිරි සියයට 10 (10%) ඉහත වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි තැන්පත් මුදලත් සමග සතු දයක අන්දමින් වැඩය නිම කර මාස තුනක් ගතවූ පසු ගෙව ලැබේ.

එන්. වේදාරණීය සෙයොන්,
උප දිසාපති.

1969. 12. 20 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේ දී ය.

1–32—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## මන්නාරම කච්චේරිය

මන්නාරම දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970. 1. 29 වැනි දින දහවල් 12.00 දක්වා මන්නාරම දිසාපති විසින් වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

1. මුල්ලිකුලම් ජනපද ව්‍යාපාරයට පිවිසෙන පාර.

2. මෙම වැඩය සඳහා 1970 ජනවාරි 28 වැනි දින දක්වා මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති විසින් මන්නාරම කච්චේරියේදී නිකුත් කරනු ලබන ටෙන්ඩර් ෆෝර්ම, ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුතුව මන්නාරම දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි කරණ ලද ටෙන්ඩර් කරුවන් සහ ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ද මේ සඳහා සුදුස්සෝ වෙති. එම සමිතිවලින් මෙම ටෙන්ඩර් ෆෝර්ම ඉදිරිපත් කිරීමේදී, ඔවුනට මේ වැඩය කිරීමට අවශ්‍ය මුදල් ඇති බවට ඔවුනගේ ප්‍රාදේශීය ප්‍රධානීන්ගෙන් ලබාගත් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය. බාහිර ටෙන්ඩර් කරුවන් විසින් ඉල්ලුම් කරණ විටදී, ඉල්ලුම්කරනු ලබන එක් එක් වැඩය වෙනුවෙන් රු. 25 බැගින් මන්නාරම කච්චේරියේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසු ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරණු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිතිවලට ද මෙසේ තැන්පත් මුදල් තැබීම අනවශ්‍ය ය.

3. 1970 ජනවාරි 29 දින පූ. භා. 12.00 ට පෙර මන්නාරම දිසාපති වෙත ලිපිකවරයේ "මන්නාරම දිස්ත්‍රික්කයේ මුල්ලිකුලම් ප්‍රවේශ පාර සෑදීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ මන්නාරම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් දැමීමට ද පුළුවන. නියමි දිනයෙහි වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් ගැන සලකා බල නොලැබේ.

4. 1970. 1. 29 දින අ. භා. 12.30 ට ටෙන්ඩර් විවෘත කරණු ලබ වේලාවේදී සියළුම ටෙන්ඩර් කරුවන්හට පැමිනීමට ඉඩ දෙනු ලැ

5. සතුටුදායක ටෙන්ඩර් කරුවන්හට ගිවිසුමකට බැඳෙන ලෙ ලියවිල්ලකින් දන්වනු ලැබේ. කොන්ත්‍රාත් කරණු ලබන මුදලි සියයට 2 ක් (2%) සතුටුදයක ලෙස නිම කිරීමට ඇප වශයෙ ඔහු විසින් තැන්පත් කළ යුතුය. මෙසේ තබන ලද මුදල් සතුටුදය ලෙස වැඩ නිම කරණ තෙක් ආපසු ගෙවනු නොලැබේ. සතුටුදය ටෙන්ඩර් කරුවන්හට මෙසේ දැනුම් දී දින 10 ක් ගෙවීමට ඉ ඔහු ගිවිසුමකට බැඳීමට අපොහොසත් වුවහොත් ඔහුගේ තැන්ප මුදල වන රු. 25 රාජ සන්තක කරණු ලැබේ.

6. නියම කරණ ලද වැඩ ප්‍රමාණයෙන් සියයට අනූවක් (90% වෙනුවෙන් මුදල් ගෙවනු ලැබේ. ඉතිරි සියයට 10 (10%) ඉහත වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි තැන්පත් මුදලත් සමග සතු දයක අන්දමින් වැඩය නිම කර මාස තුනක් ගතවූ පසු ගෙව ලැබේ.

එන්. වේදාරණීය සෙයොන්,
උප දිසාපති.

1969. 12. 20 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේ දී ය.

1–31—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

අගල් 3½" සහ අගල් 14" තෙල් කඹ සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවමින්, 1969.12.5 දා අංක 14,883 දරණ ගැසට් පත්‍රයේ පළවුණු දැන්වීම් අංක 12-139 සම්බන්ධව, ටෙන්ඩර් පත් භාරගැනීමේ වේලාව 1970.2.12 දා පස්වරු 2.30 දක්වාද, ටෙන්ඩර්පත් නිකුත් කිරීමේ අවසාන වේලාව 1970.2.10 දා දහවල් 12 දක්වා ද දිගුකරන බව මෙයින් දන්වමි.

ඇල්. ඈස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුව

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1.
2.1.1970.

1–22—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

ඈස්. කේ. 26/69.

## පරණ බඩු වෙන්දේසියයි

මෙහි පහත දැක්වෙන ප්‍රයෝජනයට ගත නොහැකි බඩු සහ පරණ නිල ඇඳුම් කොටස් 1970.1.26 දින පෙරවරු 10 ට කළුතර පොලිස් අධිකාරි කාර්යාල භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේදී බඩු ගන්නා අයවලුන් එවේලේම මුදල් ගෙවා රිසිට් පතක් ලබා ගැනීමටත් එම බඩු වෙන්දේසිය අවසන් වූ වහාම ඉවත්කර ගැනීමටත් දැනුම් දෙනු ලැබේ.

1. නිල පටි 9 යි
2. රියැදුර තොප්පි 3 යි
3. යෂ්ටි 3 යි
4. බුරුසු 15 යි
5. හම් ඉනපටි 16 යි
6. උණ්ඩ උර 15 යි
7. බූට් සපත්තු 30 යි
8. සස්ටන තොප්පි 1 යි
9. පො : ප : කැප් තොප්පි 1 යි

10. කැන්වස් සපත්තු ජෝඩු 3 යි
11. නිල ඇඳුම් පලස් 12 යි
12. කාකි දික් කලිසම් 4 යි
13. කාකි කෙටි කබා 6 යි
14. කාකි ටියුනික් කෝට් 14 යි
15. කාකි කොට කලිසම් 19 යි
16. කාකි කමිස 1 යි
17. ක : ඇස්වට පටි ජෝඩු 23 යි
18. වැහි කබා 18 යි
19. වැහි කබා පටි 2 යි
20. ඇල තොප්පි 46 යි
21. කළු සපත්තු ජෝඩු 128 යි
22. කළු මේස් ජෝඩු 5 යි
23. කාකි දිග්මේස් ජෝඩු 3 යි
24. කාකි තොප්පි 2 යි
25. අත් ඇඳි පුටු 5 යි
26. පුටු සාමාන්‍ය 4 යි
27. කාඩ් ඉන්ඩැක්ස් (රාක්කයක්) 1 යි
28. ලිපි ලේඛන රාක් 1 යි
29. කාඩ් රාක්කය 1 යි
30. කාර්යාල ලිපි බන්දේසි 6 යි
31. ලිපි ද්‍රව්‍ය රාක්ක 3 යි
32. ස්ටූල් බංකු 2 යි
33. කොහු ගුදිරි 12 යි
34. ඉබි යතුරු 3 යි
35. නිල ඇඳුම් රාක්ක 6 යි
36. මදුරු දැල් 3 යි
37. හිස් යාර බඳුන් 3 යි
38. ගැලුමෙ ටින් 25 යි
39. ගැලුම් 4 ටින් 11 යි
40. පාපැදි 5 යි
41. පාපැදි තෙල් ලාම්පු 1 යි.

ඇස්. ඩී. චන්ද්‍රසිංහ,
පොලිස් අධිකාරි, බ. ප. (දකුණ)

පොලිස් කාර්යාලය, කළුතර.
69.12.20.

1–98—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ 1970 පෙබරවාරි මස 3 වැනි දින පෙරවරු 9.30 ට ආණ්ඩුවේ මුද්‍රණාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

| | | | | |
|---|---|---|---|---|
| 1. ඉබියතුරු | ... | ... | ... | 13 |
| 2. දින මුද්‍රා | ... | ... | ... | 1 |
| 3. වැහි කෝට් | ... | ... | ... | 4 |
| 4. ඉස්කුරුප්පු නියන් | | ... | ... | 2 |
| 5. නොම්මර යන්ත්‍ර ඉලක්කම් 6 | | | ... | 25 |
| 6. කැලි 6 ටෝච් | ... | ... | ... | 2 |
| 7. නොම්මර යන්ත්‍ර අතින් ක්‍රියා කරන | | | ... | 6 |
| 8. අඬු | ... | ... | ... | 1 |
| 9. පුටු | ... | ... | ... | 12 |
| 10. බවුන් | ... | ... | ... | 1 |
| 11. ඇනමල් භාජන | | ... | ... | 3 |
| 12. පීරි | ... | ... | ... | 15 |
| 13. යතු තල | ... | ... | ... | 1 |
| 14. මෝටර් රථ අමතර කොටස් | ... | | ... | 1 ගොඩ |
| 15. වින්චෙස්ටර් බෝතල් | ... | | ... | 75 |
| 16 .පැති කන්නාඩි | ... | | ... | 1 |
| 17. ඇඩිරිමා තහඩු ... | ... | | ... | 330 |
| 18. රබර් බ්ලැන්කට් | ... | | ... | 300 |
| 19. රබර් රෝල් ... | ... | | ... | 27 |
| 20. ගිලොටින් පිහියා (විවිධ) | ... | | ... | 16 |
| 21. ප්‍රවෘත්ති පත්‍ර මීටි | ... | | ... | 1 |
| 22. ටින් (විවිධ) | ... | | ... | 1 ගොඩ |
| 23. ගැලුම් 45 ඩ්‍රම් | ... | | ... | 20 |
| 24. අතකොලි සහ ෂූටර් | ... | | ... | 1 ගොඩ |
| 25. මුද්‍රණ යන්ත්‍ර අමතර කොටස් ... | | | ... | 1 ගොඩ |

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ, 1969 දෙසැම්බර් 20.

1–100—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි පරිහරනය කරණලද පොලිස් නිල ඇඳුම් ආදිය 1970, ජනවාරි මස 26 වෙනි දින ගම්පහ පොලිස් ස්ථානයේදී පෙරවරු 9.30 සිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම භාණ්ඩයන් කාර්යාල විවෘත වේලාවන්හි ගම්පහ පොලිස් ගබඩාවේදී පරීක්ෂා කළ හැක. ඉල්ලුම්කරුවන් විසින් ගන්නා බඩු එවලේම මුදල් ගෙවා ඉවත් කළ යුතුය.

1. බයිසිකල් 42.
2. හිස් ගැලුමේ ටින් 77.
3. හිස් ගැලුම් 4 ටින් 32.
4. තුවක්කු ස්ටෑන්ඩ් 1.
5. කොහු ගුදිරි 24.
6. පිල්ටර් 1.
7. ටයිප් රයිටර් 2.
8. හම් පටි 24.
9. උණ්ඩ උර 17.
10. වැහිකබා 20.
11. ඇඳුම් කව්වල් පලස් 52.
12. කාකි හට කබා 133.
13. කාකි කැලැකබා 17.
14. කාකි කොට කලිසම් 67.
15. පො. ප. දිග කලිසම් 15.
16. පො. ප. කැලැකබා 18.
17. පො. ප. හටකබා 3.
18. පො. ප. සුදු හටකබා 1.
19. පො. ප. සුදු දිග කලිසම් 1.
20. පො. ප. කැප් තොප්පි 4.
21. පො. ප. හම්පටි 4.
22. ඇලතොප්පි 110.
23. සපත්තු කුට්ටම් 214.
24. බූට් සපත්තු කුට්ටම් 48.
25. රබර් සපත්තු කුට්ටම් 10.
26. මේස් කුට්ටම් 37.
27. පටිස් කුට්ටම් 60.
28. බෙරේ තොප්පි 7.
29. මදුරුඇල් ඔබල් 2.
30. මදුරුඇල් තනි 8.
31. රේඩියෝ සැට් 1.
32. තීන්ත කුඩු 6.
33. කාකි තොප්පි 14.
34. මනින පටි 1.
35. බුරුසු 28.
36. කිට් පෙට්ටි 2.
37. ඉබි යතුරු 19.
38. වැහිකබා පටි 11.
39. කාකි පටි 7.
40. සට්ටන තොප්පි 1.
41. වැහිකබා බකල් 1.
42. හොල්ස්ටර් 3.
43. පච්චස් 3.

සහකාර පොලිස් අධිකාරි,
බස්නාහිර පළාත (උ).

3. 12. 69.

1–123—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### අබලන් ඇක්ස්රේ භාණ්ඩ වෙන්දේසිය—ලය රෝහල වැලිසර (ක්‍ෂය රෝග මර්දන ව්‍යාපාරය)

වැලිසර ලය රෝහලේ ඇති පහත දක්වෙන අබලන් ඇක්ස්රේ භාණ්ඩ 1970.1.27 වන දින පෙ. ව. 10.30 ට වෙන්දේසියේ එම ස්ථානයේදී විකුණනු ලැබේ :—

1. ස්ටෑන්ඩ් එක සහිත සෝල්ඩරින් අයන් 1
2. අඬු 1
3. සේයාපටල ඔතන පට්ටම් 6
4. ඇවෝ මීටර් 1
5. ඇම්පියර් මීටර් 1
6. අඟල් 12×10 කැසට් 12
7. අඟල් 10×8 කැසට් 2
8. ඇක්ස්රේ සේයාපටල ප්‍රදීප්තිකය 3
9. අඟල් 4×5 කැසට් 27
10. සේයාපටල දවටන 4"×5" 54
11. ඇක්ස්රේ යන්ත්‍රයක සවිකරන වෝල්ට් මීටර් 1
12. සීමන්ස් මි. ඇ. 50 එක්ස්රේ යන්ත්‍රය (ට්‍රාන්ස්ෆෝමරය හැර) 1
13. සීමන්ස් මි. ඇ. 6 ඇක්ස්රේ යන්ත්‍රය (රොන්ජන්ස්කෝප්) 2
14. සීමන්ස් මි. ඇ. 300 ඇක්ස්රේ යන්ත්‍රය (ප්ලැනිග්‍රාෆ් ඒකකය) 1
15. වොට්සන්ස් අඟල් 4×5 ප්‍රමාණයේ කැමරා ඒකකය හා මි. ඇ. 250 ජී. ඊ. ක්‍රියාකාරී පැනලය 1
16. වියලීම් කැබිනට් 2
17. පා ස්විච් ඇණය 1
18. ඉන්ටර්වල් ටයිමර්ස් 1
19. අතෙහි පාවිච්චි කරන විකිරණයෙන් විණිවිද දක්නය 1
20. ෆ්ලුරෝසන්ට් ස්ක්‍රීන් 1
21. එක්ස්රේ ප්ලුරොස්කෝපික් යන්ත්‍රය (බෙර් ඒප්‍රනයක් ග්ලවුස් ජෝඩුවක් හා ගොගල්ස් ජෝඩුවක්) 1
22. ඩිවෙලපිං හැන්ගර්ස් 15"×12" 13
23. අඟල් 15"×12" කැසට් 19

2. විකුණන දිනට පෙර දින පෙ. ව. 9 සිට පස්වරු 3 දක්වා බඩු පරීක්‍ෂාකර බැලිය හැක.

3. මිලදී ගත් බඩු වෙනුවෙන් මුදල් ගෙවීම එවලේම කළයුතු අතර එදිනම සවස 4.30 ට කලින් එම බඩු ඉවත් කරගත යුතුයි.

ක්‍ෂය රෝග මර්දන ව්‍යාපාර අධිකාරී.

1969.10.14 වැනි දින,
කොළඹ 12 හිදීය.

1–116—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාලම් පාරු රේන්ද

(1) ගංගෙයි (2) මූතූර් (3) කිලිවෙඩ්ඩි (4) උප්පාර් (5) සලපෙයි ආරු (6) කඩ්ඩේ පරිච්චාන් (7) පුඩවයිකාඩු (8) යාන්ඔය සහ (9) ඉඩ්ඩිමන් තුරේ යන පාලම් පාරු 1970 පෙබරවාරි මස 1 වෙනි දින සිට ආරම්භ වන එක් අවුරුදු කාල සීමාව සඳහා විකිණීමට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති විසින් 1970 ජනවාරි 26 වැනි දින පෙරවරු 10වන තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් ත්‍රිකුණාමලය කච්චේරියෙහි රු. 100ක මුදලක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටදී ත්‍රිකුණාමලය කච්චේරියෙන් ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට හැකිය. 1970 ජනවාරි 26 වැනි දින පස්වරු 3.00 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම නියමිත දින පෙරවරු 10 ට සිදු කරනු ලබන අතර ඒ අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්හට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ලේඛනගත තැපෑලෙන් ඉදිරිපත් නොකරනු ලබන ටෙන්ඩර් පත් පුද්ගලිකව පැමිණ කච්චේරියට භාර දිය යුතුය. එය බහා එවන කවරයෙහි සේවා විස්තර සහ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව සඳහන් කර එවිය යුතුය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුදලෙන් තුනෙන් කොටසක් ඇප මුදලක් වශයෙන් කලින් ගෙවිය යුතුය.

ස්වකීය ටෙන්ඩරය භාරගත් බවට ලිඛිත දැන්වීමක් ලද තුන් දිනක් ඇතුළත කිසියම් ටෙන්ඩර්කරුවකු විසින් ඒ සම්බන්ධ ගිවිසුමකට බැඳීමට හෝ නියමිත ඇප මුදල තැන්පත් කිරීමට හෝ අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කර ඇති ටෙන්ඩර් පත්‍ර මුදල් අහිමි වනු ඇත.

ටෙන්ඩර් කොන්දේසි සතියේ ඕනෑම දිනයක (පෝදා හැර) පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා (පෝදිනට පෙර දින නම් පෙරවරු 9 සිට පස්වරු 1 දක්වා) ත්‍රිකුණාමලය කච්චේරියේදී බලා ගත හැක.

කිසියම් ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් කිසිදු ප්‍රශ්නයක් නැතිව ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති සතුවේ.

ඇස්. සිවඥානම්,
සහකාර දිසාපති,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

1969 දෙසැම්බර් මස 22 වැනි දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේදීය.

1–24—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### උකස් නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියක්

පානදුර දිස්ත්‍රික් උසාවියේ දීය

1. ඩොරති සැලිනා පර්ල් ඔපාත විවාහයට පෙර විජේමාන්න— හොරණ පදිංචිව සිට නැසී ගිය නොයෙලින් පිලිෂියා බියට්‍රිස් ජයසිංහ විවාහයට පෙර විජේමාන්න මහත්මියගේ බුදලයේ අද්මිනිස්ත්‍රාත් බලකාරී.
2. කැලිස්ටස් අජන්ත ජයසිංහ සහ
3. බර්තා ප්ලොරන්ස් නෙලුම් ජයසිංහ, නො. 24, ශ්‍රී සෝමානන්ද පාර, හොරණ ................................. පැමිණිලිකරුවෝ.

නො. 1463 (ඇම්. බී) එදිරිව

1. හපුතන්ත්‍රිගේ ඥාන් හෙන්ද්‍රික් ගුණසේකර
2. හපුතන්ත්‍රිගේ අමරදාස ගුණසේකර
3. හපුතන්ත්‍රිගේ අමරාවතී ගුණසේකර
4. හපුතන්ත්‍රිගේ ජිනදාස ගුණසේකර, ජඹුරලිය, උඩුගහපත්තු, සල්පිටි කෝරළේ ......................................... විත්තිකරුවෝ.

ඉහත සඳහන් උගස් නඩුවෙන් මට ලැබී තිබෙන බලය ප්‍රකාර විත්තිකාර පක්ෂය විසින් පැමිණිලිකාර පක්ෂයට ගෙවිය යුතු එම නඩු තීන්දුවේ මුදල වන රුපියල් හත්දහස් හය සියය (රු. 7,600)ක්ද 1964 අප්‍රේල් 2 වැනි දින සිට 1968 ජනවාරි 24 වැනිදා දක්වා රුපියල් හත් දාහකට (රු. 7,000) අවුරුද්දට සියයට පහළොව (15%) ගණනේ පොළියද එදින සිට මුළු මුදල ගෙවන තෙක් අවුරුද්දට සියයට පහ (5%) ගණනේ පොළියක්ද නඩු ගාස්තු වශයෙන් ගෙවිය යුතු රුපියල් පන්සිය පණස් හතරයි ශත හැට හතරක මුදලද (රු. 554.64) විත්තී පක්ෂයෙන් අයකර ගැනීම සඳහා පහත සඳහන් දේපල 1970 ජනවාරි මස 30 වැනි දින උදේ 10ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### ඉඩමේ විස්තරය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ උඩුගහ පත්තුවේ ජඹුරලියේ පිහිටි උතුරට කන්දගේ අයට අයිති ඉඩමද නැගෙනහිරට : ගල්පාතගේ ලැබුම් බිමද, දකුණට : ගල්පාතගේ වත්තද සහ බස්නාහිරට : ගලේවිල නොහොත් අලුබෝගහ කුඹුරද මායිම් වන අක්කර 6, රූඩ් 1 බිම් ප්‍රමාණයක් ඇති කරඳ ගහවත්තෙන් නොබෙදාපු අක්කර 2ක් හා එහි ඇති ගහකොළ වැවිලිද, අලුත සාදන ලද උළු සෙවිලි ගෙයද සහ එහි ඇති අනිකුත් දේද වේ.

වැඩි විස්තර වී. වී. කන්නන්ගර පෙරකදෝරු මහතාගෙන් හෝ මගෙන් විමසන්න.

ආර්. ඩබ්ලිව්. ප්‍රනාන්දු,
උසාවියේ වෙන්දේසි හා තක්සේරුකාර තැන.

කාර්‍යාලය :
40සී, ග්‍රැවට්ස් පාර, පානදුර.

1–61—70.1.2 දින අංක 14,887 දරන ගැසට් පත්‍රය

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ **ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දින වලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම් පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

**13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු—**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | ශ. | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් ... ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 60 | 0 | 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.**

උපලේඛනය

**1969**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් | ... | 69.12. 5 සිකුරාද | ... | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.12 සිකුරාද | ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 69.12.19 සිකුරාද | ... | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.26 සිකුරාද | ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

**1970**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 70. 1. 2 සිකුරාද | ... | 69.12.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 1. 9 සිකුරාද | ... | 70. 1. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 1.16 සිකුරාද | ... | 70. 1. 8 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 1.23 සිකුරාද | ... | 70. 1.16 සිකුරාද | පෙ.ව. | 12.00 |
| | | 70. 1.29 බ්‍රහස්පතින්ද | ... | 70. 1.21 බදාද | පෙ.ව. | 12.00 |
| පෙබරවාරි | ... | 70. 2. 5 බ්‍රහස්පතින්ද | ... | 70. 1.28 බදාද | ප.ව. | 3.30 |
| | | 70. 2.13 සිකුරාද | ... | 70. 2. 5 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.00 |
| | | 70. 2.20 සිකුරාද | ... | 70. 2.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 2.27 සිකුරාද | ... | 70. 2.20 සිකුරාද | පෙ.ව. | 12.00 |
| මාර්තු | ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ... | 70. 2.27 සිකුරාද | පෙ.ව. | 12.00 |
| | | 70. 3.13 සිකුරාද | ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 3.20 සිකුරාද | ... | 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 3.26 බ්‍රහස්පතින්ද | ... | 70. 3.20 සිකුරාද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1969 දෙසැම්බර් 12 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි